දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

| | | |
|---|---|---|
| අමාත්‍යතුමා<br>அமைச்சர்<br>Minister | } | 2784832 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | } | 2784811 |
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | } | 2785141-50<br>Fax: 2784846 |

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

මගේ අංකය / எனது இல. / My No. } ED/01/26/03/01/02

දිනය / திகதி / Date } 2014 – 03 - 19

චක්‍රලේඛ අංකය - 06/2014

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්

විභාග කොමසාරිස් ජනරාල්

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා

සියලු ම විදුහල්පතිවරුන්

## <u>සංශෝධිත විෂය නිර්දේශය</u>

## <u>අ.පො.ස. (උ. පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය</u>

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පසු විපරම් සිදු කිරීමෙන් අනතුරුව අ.පො.ස. (උ. පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය නිර්දේශය සංශෝධනය කර ඇත.

ඒ අනුව 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ විෂය නිර්දේශයේ, ඇතුළත් ව තිබූ පහත දක්වා ඇති නිපුණතා මට්ටම්වලට අදාළ ව විෂයය අන්තර්ගත කොටස් හෝ සම්පූර්ණ නිපුණතා මට්ටම හෝ පහත සඳහන් පරිදි ඉවත්කර ඇත.

| නිපුණතා මට්ටම | ඉවත් කරන ලද විෂය අන්තර්ගතය |
|---|---|
| නිපුණතා මට්ටම 1.1 | • දැනුම පිළිබඳ නිර්වචනය |
| නිපුණතා මට්ටම 1.5 | • සෝදිසි සංඛ්‍යාංක භාවිතය (දත්ත වලංගුතා ක්‍රම යටතේ ඇති)<br>• දත්ත සත්‍යාපනය (දත්ත ආදාන ආකාර යටතේ) |
| නිපුණතා මට්ටම 1.6 | • ප්‍රචාරණ කටයුතු සඳහා<br>• ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා |

| | |
|---|---|
| නිපුණතා මට්ටම 1.7 | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සහ අනිකුත් තාක්ෂණයන් |
| නිපුණතා මට්ටම 2.1 | • නූතන පරිගණක දෙසට |
| නිපුණතා මට්ටම 2.3 | • උපදෙස් මාලා නිර්මිතය (ISA)<br>• සංකීර්ණ උපදෙස් මාලා පරිගණක ආකෘති (CISC) නිර්මිතය සහ ඌණිත උපදෙස් මාලා පරිගණක ආකෘති (RISC) නිර්මිතය |
| නිපුණතා මට්ටම 3.4 | • ඉපිලෙන ලක්ෂ්‍යය සංඛ්‍යා යටතේ ඇති IEEE 754 බිටු තිස් දෙකෙහි ඒකමය නියතාර්ත නිරූපනය |
| නිපුණතා මට්ටම 5.3 | • මුල් යුගයේ මතක සංවිධානය (මතක සංවිධානය යටතේ)<br>• අතථ්‍ය මතක කළමණාකරනය (ද්විතීයික ගබඩාවන් නඩත්තුව යටතේ) |
| නිපුණතා මට්ටම 6.1 | • අතථ්‍ය යන්ත්‍ර (මෙහෙයුම් පද්ධතියක අවශ්‍යතාව යටතේ) |
| නිපුණතා මට්ටම 7.11 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |
| නිපුණතා මට්ටම 7.12 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |
| නිපුණතා මට්ට 7.15 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |
| නිපුණතා මට්ටම 8.3 | • මූලික අංකිත කේතාංකන ක්‍රම |
| නිපුණතා මට්ටම 9.3 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |
| නිපුණතා මට්ටම 9.4 | • දත්ත සමුදාය යටතේ ඇති අභි දත්ත<br>• යෙදුම් ක්‍රමලේඛ |
| නිපුණතා මට්ටම 9.5 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |
| නිපුණතා මට්ටම 9.10 | • දත්ත පාලන භාෂාව (DCL)<br>• දෘෂ්‍ය අර්ථ නිරූපන භාෂාව (VDL) |
| නිපුණතා මට්ටම 10.6 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |
| නිපුණතා මට්ටම 10.7 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |
| නිපුණතා මට්ටම 10.8 | • සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. |

ඉහත සඳහන් කළ විෂයය අන්තර්ගතයන් ඉවත් කළ පසු විෂය නිර්දේශය තුළ නිපුණතා මට්ටම්වලට අදාළ අංක ද සංශෝධනය කර ඇත. ඒ අනුව සකස් කළ සංශෝධිත විෂය නිර්දේශය මේ සමඟ අමුණා ඇති අතර www.moe.gov.lk සහ www.nie.lk යන වෙබ් අඩවිවලද ඇතුළත් කර ඇත. මෙම සංශෝධිත විෂය නිර්දේශයට නව විෂය කොටස් ඇතුළත් වි නොමැති අතර පැරණි විෂය නිර්දේශයේ අඩංගු සමහර විෂයය කොටස් පමණක් ඉවත් කිරීම සිදු වී ඇත.

2015 වර්ෂයේදී අ.පො.ස. (උ. පෙළ) විභාගය සඳහා පෙනී සිටින සිසුන් ඉලක්ක කර ගනිමින් සංශෝධිත විෂය නිර්දේශය ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව 2015 හා ඉන් ඉදිරියට පැවැත්වෙන අ.පො.ස.(උ. පෙළ) විභාගවල දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයට පෙනී සිටින සියලු ම සිසුන් සඳහා සංශෝධිත විෂය නිර්දේශයට අනුකූලවන ආකාරයට ප්‍රශ්න පත්‍ර සකස් කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් සියලු ම ගුරුභවතුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය බව කාරුණිකව අවධාරණය කරමි.

අනුර දිසානායක

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය